**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය**

පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (බාහිර) සඳහා අයදුම්පත් කැඳවීම (කාලය දීර්ඝ කරන ලදී)**
**2025 වර්ෂය**

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ (බාහිර) 2025 වර්ෂය සඳහා නවක සිසුන් (ගිහි හා පැවිදි දෙපාර්ශ්වයෙන්ම) බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (බාහිර) - Bachelor of Arts Degree Programme (External)**

| | | |
|---|---|---|
| **පාඨමාලා කාලය** | : | වසර 03කි. |
| SLQF **ස්තරය** | : | Level 05 (Bachelor Degree) |
| **අර්ඝ** (Credits) | : | 114 |
| **අවම සුදුසුකම්** | : | 1. බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත, සිංහල යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක්වත් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30ක් ලබා තිබීම.<br>**හෝ**<br>**2.** ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30ක් ලබා තිබීම<br>සහ<br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය විෂයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත්වීම හෝ දහම් පාසල් අවසාන පරීක්ෂණය සමත්වීම.<br>**හෝ**<br>3. ප්‍රාචීන මධ්‍යම විභාගය භාෂාත්‍රයෙන් සමත්වීම<br>**හෝ**<br>4. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් විභාගයකින් සමත්වීම |

**අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම**

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට කාර්යාල වේලාව තුළ පැමිණ හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.busl.ac.lk) ලබාගත හැකිය.

**අයදුම්පත් ගාස්තුව**

අයදුම්පත් ගාස්තුව රු.3,000/- කි. මෙම මුදල ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක **008-1001-7001-4461** දරන ගිණුමට බැර කළ හැකිය. (මහජන බැංකුවේ ගිණුම් අංකයට මුදල් බැර කරන විට ලදුපතෙහි **හේතුව** යන තීරයේ **EXD -10** ලෙස සඳහන් කිරීම අනිවාර්ය වේ.)

**අයදුම්පත් භාරගැනීම හා ලියාපදිංචි කිරීම**

අයදුම්පත් බාරගැනීම හා ලියාපදිංචි කිරීම 2026.01.15 දින දක්වා පෙ.ව.09.00 - ප.ව.03.30 අතර පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ දී සිදුකරනු ලබන අතර ඒ සඳහා අයදුම්කරුවන්ට පහත සඳහන් ලේඛන සමග පැමිණ ලියාපදිංචි විය හැක.

1) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
2) විභාග දෙපාර්තමේන්තුව/ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් නිකුත්කර ඇති අධ්‍යාපන සහතිකවල මුල්පිටපත් හා සහතික කරන ලද පිටපත්
3) උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත (සහතික කරන ලද පිටපත් සමග)
4) අයදුම්පත් ගාස්තුව (**රු.3,000/-**) ගෙවූ ලදුපත
5) නිල් පසුබිම සහිත පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් (පසුපිටේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කළ යුතු වේ)
6) නිසි පරිදි සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය හැඳුනුම්පත සකස් කිරීමේ ආකෘතිපත්‍රය

**පාඨමාලා ගාස්තුව**

| | | |
|---|---|---|
| පළමු වසර සඳහා | රු. 31,000.00 | පළමු වසර සඳහා ලියාපදිංචි වීමේදී ගෙවිය යුතුවේ. |
| දෙවන වසර සඳහා | රු. 29,500.00 | දෙවන වසර සඳහා ලියාපදිංචි වීමේදී ගෙවිය යුතුවේ. |
| තෙවන වසර සඳහා | රු. 29,500.00 | තෙවන වසර සඳහා ලියාපදිංචි වීමේදී ගෙවිය යුතුවේ. |
| **එකතුව** | **රු.90,000.00** | |

**වැඩිදුර විස්තර සඳහා**
පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025 - 2057978)
විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි (රාජකාරි කටයුතු ඉටු කරන),
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුරය.
2025.12.22